# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 34 දරන බිබ්ලිඹ්මේනියා අධ්‍යාපන ග්‍රන්ථ සඳහා වූ ජාතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ජුනි මස 26 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ජුනි මස 26 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 34 දරන බිබිලිඕමේනියා අධ්‍යාපන ග්‍රන්ථ සඳහා වූ ජාතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 ජූනි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. අයි. එන්. සී. 10/2005.

### බිබ්ලිඕමේනියා අධ්‍යාපන ග්‍රන්ථ සඳහා වූ ජාතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

“බිබ්ලිඕමේනියා අධ්‍යාපන ග්‍රන්ථ සඳහා වූ ජාතික පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 34 දරන බිබ්ලිඕමේනියා අධ්‍යාපන ග්‍රන්ථ සඳහා වූ ජාතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) බිබ්ලිඕමේනියා අධ්‍යාපන ග්‍රන්ථ සඳහා වූ ජාතික පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “බිබ්ලිඕමේනියා අධ්‍යාපන ග්‍රන්ථ සඳහා වූ ජාතික පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. බිබ්ලිඕමේනියා අධ්‍යාපන ග්‍රන්ථ සඳහා වූ ජාතික පදනම සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ඉතා අත්‍යවශ්‍ය සහ වැදගත් අධ්‍යාපනික පොත්පත් දිවයින පුරා සිංහලෙන් හා දෙමළෙන් ප්‍රකාශ කිරීමට, මුද්‍රණය කිරීමට, පරිවර්තනය කිරීමට සහ බෙදා හැරීමට භාර ගැනීම සහ ජාත්‍යන්තර වැදගත්කමකින් යුත් ග්‍රන්ථ ආනයනය කිරීම;

(ආ) අධ්‍යාපනික ආයතනවල ඇති පුස්තකාලවල පහසුකම් වැඩිදියුණු කිරීම සහ උසස් තත්ත්වයට පත් කිරීම;

(ඇ) රට පුරා පුස්තකාල, ජංගම පුස්තකාල සහ "ජාතිය සඳහා පොත්පත්" බෙදා හැරීමේ ජංගම මධ්‍යස්ථාන පිහිටුවීම සහ ඒවා පවත්වාගෙන යාම;

(ඈ) බාල, තරුණ සහ වැඩිහිටි දිළිඳු ජනතාවට උසස් අධ්‍යාපනයෙහි නියැලීම සඳහා අවශ්‍ය වන පොත්පත් සහ වෙනත් ප්‍රකාශන වලට ප්‍රවේශය ලබා ගැනීමට හැකිකර වීම සහ එම පොත්පත් සාධාරණ මිලකට ඔවුන්ට ලබා දීම;

(ඉ) ග්‍රන්ථ ප්‍රකාශනය, සිංහල සහ දෙමළ භාෂාවලට පොත්පත් පරිවර්තනය කිරීම සහ ශ්‍රී ලංකාව තුළ පොත්පත් බෙදා හැරීම යන ක්ෂේත්‍රයන්ට අදාළව වෘත්තීයමය සහ අධ්‍යාපනික පාඨමාලා සහ පර්යේෂණ කටයුතු සංවිධානය කිරීම සහ අන්තර්ජාල වෙබ් අඩවි පාවිච්චි කිරීමට අවස්ථාව ලබා දීම සඳහා දිවයින පුරා මධ්‍යස්ථාන විවෘත කිරීම;

(ඊ) අනාථ සහ දිළිඳු පිරිස්වලට පොත්පත්, සඟරා සහ වෙනත් අධ්‍යාපනික ආධාර ලබා දීම;

(උ) සංස්ථාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා උපකාර වන ස්වේච්ඡා සේවකයන්ට ශිෂ්‍යත්ව ලබා දීම සහ වෙනත් ක්‍රමවලින් මූල්‍ය ආධාර සැපයීම;

(ඌ) සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති වෙනත් සංගම්, සමිති හෝ සමාගම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීමේලා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම.

අධ්‍යාපනික අවශ්‍යතා මුද්‍රණය කිරීමට සහ බෙදාහැරීමට පූර්ව අනුමතිය ලබාදීම.

**4.** 3 වන වගන්තිය යටතේ වූ සංස්ථාවේ පරමාර්ථ වැඩිදුරටත් ඉටුකර ගැනීම සඳහා විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රචාරණය කරන ලද හෝ හඳුන්වා දුන් යම් ප්‍රකාශනයක් හෝ වෙනත් මුද්‍රිත අධ්‍යාපනික උපකාරක, දිවයින පුරා බෙදා හැරීමට හෝ ශිෂ්‍යයන් හට ලබා ගැනීමට සලස්වන අවස්ථාවක දී, සංස්ථාව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතිය ලබා ගත යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම, මේ පනතේ විධිවිධාන සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත් ව එම රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හා ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද, සභාපතිවරයෙක්, ලේකම්වරයෙක් හා තවත් ධුර දරන්නන් දෙදෙනකු සහ වෙනත් යම් තැනැත්තන්ගෙන් සමන්විත වූ ද (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) විධායක කමිටුවක් වෙත පැවරෙන්නේ ය.

(2) යම් නිලධරයකුගේ ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ මරණය නිසා කමිටුවෙහි යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත්, එකී පුරප්පාඩුව සංස්ථාවේ රීතිවලට අනුකූලව පිරවිය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, පදනමේ විධායක කමිටුවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ බලතල.

6. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා මුදල් ණයට ගැනීමට හෝ අරමුදල් නංවාලීමට;

(ආ) විනිමය බලපත්‍ර, චෙක්පත්, පොරොන්දු පත්‍ර සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර

ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිල දී ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඇ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් කමිටුව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකට ආයෝජනය කිරීමට;

(ඈ) සියලු වර්ගවලට අයත් දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන් සහ ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට;

(ඉ) යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග එකඟවීම් වලට හෝ ගිවිසුම්වලට එළඹීමට ;

(ඊ) අනුයෝජිතයන්, සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන්, පත් කිරීමට, සේවයේ නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට ;

(උ) සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා උප කමිටු පත් කිරීමට; සහ

(ඌ) සංස්ථාවේ අරමුණු මුදුන් පත්කර ගැනීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සංස්ථාව විසින් එහි යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් බඳවා ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඉවත්වීම හෝ ඔවුන් නිලයෙන් නෙරපීම;

(ඇ) සංස්ථාවේ ධුර දරන්නන්, අනුයෝජිතයන්, නිලධරයන් සහ සේවකයන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සහ උප කමිටුවල රැස්වීම්වලදී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම කැඳවීම සහ පැවැත්වීම සහ එකී රැස්වීම් පැවැත්විය යුතු වේලාවල්, ස්ථාන, ඒ පිළිබඳ දැන්වීම, එකී රැස්වීම්වල ගණපූරණය සහ එකී රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම හා එහි අරමුදල් භාරයේ තබා ගැනීම ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක්, (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන්ම සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සෑම සාමාජිකයකු ම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්තමේන්තු නීයාදනයකින් දේපළ බැහැර කිරීමක් මත හෝ අන්‍යාකාරයකින් හෝ ලැබෙන චංචල හෝ නිශ්චල සියලු දේපළ අත් කර ගැනීමට හෝ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. තවද එම දේපළ, 7 වන වගන්තිය යටතේ සාදන ලද රීති වලට යටත්ව විකිණීමේ, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙර පැවති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් පිහිටුවනු ලබන්නා වූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එම දිනයේ දී පදනමට අයවිය

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

යුතු වූ සියලු ණය සහ පදනමට ගෙවිය යුතු වූ සම්මාදම් සහ දායක මුදල්, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**10.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, නීයාදන, තෙස්තමේන්තු නීයාදන, පැවැරුම්, දායක මුදල්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් සංස්ථාවට ලැබෙන සියලු මුදල් කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි, බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**11.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සුදුසුකම්ලත් විගණකවරයකු එනම්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය දරන්නා වූ ද, සංස්ථාව විසින් පත් කරනු ලබන්නා වූ ද විගණකවරයකු විසින් විගණනය කළ යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, එම දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ ලාභ තම සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් එවැනි සංගමයකට හෝ සංගම්වලට, එම දේපළ දීම හෝ පැවරීම කළ යුතු ය. එම සංගමය හෝ සංගම්, සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ විසුරුවා හැරීමට ප්‍රථමයෙන්, සංස්ථාවේ සාමාජිකයන් විසින් නිශ්චය කළ යුතු ය.

**13.** සංස්ථාවේ ඉඩම් සහ දේපළ කවර ආකාරයකින් ව්‍යුත්පන්න වුව ද, හුදෙක්ම මෙහි දක්වා ඇති පරිදි සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසාම අදාළ කළ යුතු අතර, ඉන් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ හෝ ලාභ වශයෙන් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ ඉඩම් සහ දේපළ අදාළ කිරීම.

**14.** සංස්ථාවේ කිසිම සාමාජිකයෙක්, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා, ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් සාමාජික මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**15.** (1) සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු අතර, කමිටුව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කළ හැකි ය.

සංස්ථාවේ මුද්‍රාව.

(2) සභාපති සහ ලේකම්වරයා ඉදිරියේ හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් තම නම් සාධන පත්‍රයෙහි අත්සන් තැබිය යුතු ය. තව ද, එම අත්සන් කිරීම යම් තැනැත්තකු විසින් සාක්ෂිකරුවකු වශයෙන් කරන ලද අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

**16.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ යම් සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.